සැ. යු.- 2015.01.16 දින පළවූ අංක 1898 දරන ගැසට් පත්‍රයේ II සහ III කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,899 - 2015 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2015.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 392 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 395 |


*සැ. යු.* - ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත 2014 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 පෙබරවාරි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## ගාල්ල මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලා බලපත්‍ර දීමේ පනත යටතේ විරෝධතා කැඳවීම

පහත ලේඛනය සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන ස්ථානයන්හි සමාජ ශාලාවක් පවත්වා ගෙන යාම සඳහා 2015 වර්ෂයට බලපත්‍රයක් ලබාගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලා බලපත්‍ර දීමේ පනත 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රය පල වූ දින සිට සති 04 ක් ඇතුලත තම විරුද්ධත්වයට හේතු පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමු.

මෛත්සිරි ද සිල්වා,
නගරාධිපති,
මහා නගර සභාව,
ගාල්ල.

2014 දෙසැම්බර් මස 31 වැනි දින,
මහා නගර සභාව,
ගාල්ල.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජ ශාලාවේ ලේකම් සභාපති/කළමණාකරුද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ කටයුතු කෙරෙන ලිපිනය* |
|---|---|---|---|
| ආර්. එච්. ජයසූරිය මයා | ලේකම් | ගාලු සේවා සමාජය | අංක 02, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල |

01-529

---

## මීගමුව මහ නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥා පනතේ (272) අධිකාරි 17 දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නිසි බලධාරියා වශයෙන් මීගමුව මහ නගර සභාවේ නගරාධිපති ඇන්ටනී ජයවීර වන මම 2015 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් දින වල ද පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් ප්‍රකාශ කරන දිනවල ද මීගමුව නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම, මස් වෙළඳාම් කිරීම හා මස් කඩ විවෘතව තැබීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

ඇන්ටනී ජයවීර,
නගරාධිපති,
මහ නගර සභාව,
මීගමුව.

*උපලේඛනය*

2015.01.15 දෙමළ තෛපොංගල් දිනය

2015.01.04 දුරුතු පුර පසළොස්වක පෝය දිනය

2015.02.03 නවම් පුර පසළොස්වක පෝය දිනය

2015.02.04 ජාතික නිදහස් දිනය

2015.03.05 මැදින් පුර පසළොස්වක පෝය දිනය

2015.04.03 බක් පුර පසළොස්වක පෝය දිනය

2015.05.03 වෙසක් පුර පසළොස්වක පෝය දිනය

2015.05.04 වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දින

2015.06.02 පොසොන් පුර පසළොස්වක පෝය දිනය

2015.07.01 අධි ඇසළ පුර පසළොස්වක පෝය දිනය

2015.07.31 ඇසළ පුර පසළොස්වක පෝය දිනය

2015.08.29 නිකිණි පුර පසළොස්වක පෝය දිනය

2015.09.27 බිනර පුර පසළොස්වක පෝය දිනය

2015.10.04 ලෝක සත්ව දිනය

2015.10.27 වප් පුර පසළොස්වක පෝය දිනය

2015.11.25 ඉල් පුර පසළොස්වක පෝය දිනය

2015.12.24 උඳුවප් පුර පසළොස්වක පෝය දිනය

01-553

## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 31 වනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක (04) xiii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදන කරමි.

එච්. ඒ. යූ. ධම්මික හෙට්ටිආරච්චි,
සභාපති,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 31 වෙනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේදී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (01) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීම හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 20 ට 1 ට වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධන නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2015 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 2% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධන නොකළ ඉඩම් මත බද්ධ කොබෙයිගනේ ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් විධාන කළ යුතු යැයි කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

එච්. ඒ. යූ. ධම්මික හෙට්ටිආරච්චි,
සභාපති,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

01-622

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්ති ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ග දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.11.14,2014.01.21, 2014.03.13 හා 2014.04.10 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාල මාර්ග වලට අදාල ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශයවන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30 ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සළකා මෙම ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ග දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දැනුම් දෙමි.

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | දකුණුපස ඉඩම් | වම්පස ඉඩම් | මාර්ගයේ දිග (මීටර්) | මාර්ගයේ පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|
| 01 | රණවිරු මාවත | බෝගහවත්ත පාර | (i) දයාපාල මහතාගේ ඉඩම<br>(ii) බමුණුසිංහවත්ත<br>(iii) රොබට් පත්මසිරි මහතාගේ ඉඩම | (i) පිනිදිය ස්ටෝර්ස් ඉඩම<br>(ii) ක්‍රිෂාන්ත මහතාගේ ඉඩම<br>(iii) බමුණුසිංහ ඉඩම<br>(iv) බර්ටි අබේවර්ධන මහතාගේ ඉඩම<br>(v) සුමිත් මහතාගේ ඉඩම<br>(vi) වෙද ගෙදර | 300 | 08 |
| 02 | නිසල මාවත | අළුත් පාර | (i) එච්. බී. චන්ද්‍රසේන මහතාගේ ඉඩම | (i) ප්‍රදීප් ප්‍රියන්ත මහතාගේ ඉඩම<br>(ii) පී. ජී. උදුලා මහත්මියගේ ඉඩම | 100 | 03 |

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *දකුණුපස ඉඩම්* | *වම්පස ඉඩම්* | *මාර්ගයේ දිග (මීටර්)* | *මාර්ගයේ පළල (මීටර්)* |
|---|---|---|---|---|---|---|
| | | | (ii) ජී. ඒ. ශානිකා මහත්මියගේ ඉඩම | (iii) පී. ජී. අමිතා මහත්මියගේ ඉඩම<br>(iv) පී. ජී. තුෂාර මහතාගේ ඉඩම | | |
| 03 | එදිරිසූරිය මාවත | උඩදෙනිය රවුම් පාර | (i) අඹගහවත්ත<br>(ii) මහවත්ත<br>(iii) කලුගෙහේන<br>(iv) ජානිස්ගෙවත්ත | (i) පලුගස්කොරටුව<br>(ii) ජානිස් කොරටුව<br>(iii) පහළවත්ත<br>(iv) පහළරුප්ප | 306 මීටර් | 4.57 මීටර් |
| 04 | ජය මාවත | කජ්ජුගස්කොරටුව මාර්ගය | (i) ධර්මසේන මහතාගේ ඉඩම<br>(ii) ඩී. මාලනී මහත්මියගේ ඉඩම<br>(iii)ජී. කේ. ගාමිණී මහතාගේ ඉඩම | (i) එන්. සෝමපාල මහතාගේ ඉඩම<br>(ii) බී. එච්. බන්දුසේන මහතාගේ ඉඩම<br>(iii) ප්‍රියන්ත මහතාගේ ඉඩම<br>(iv) ඩී. සොමිපාල මහතාගේ ඉඩම | 75 මීටර් | 03 මීටර් |

01-631

---

**කුරුවිට ප්‍රාදේශීය සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරිය)

2014 දෙසැම්බර් 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 4 (ආ) කොටසේ පල වූ පහත උපලේඛනයේ සඳහන් ගෝඝාතකාගාරය සඳහා බලපත්‍ර ලබා දීමට විරෝධතා කැඳ වූවද අදාළ කාල සීමාව තුළ විරෝධතා කිසිවක් නොවූයෙන් අදාළ ඉල්ලුම්කරු වෙත එම බලපත්‍ර 2015 දෙසැම්බර් 31 දක්වා ලබා දෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

**උපලේඛනය**

| | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ගෝඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|---|
| 01. | එම්. ඒ. රහුමාන් මයා<br>අංක 466/සී/35/1,<br>තලාවිටියවත්ත, උඩහගම,<br>ඇහැළියගොඩ. | තලාවිටිය වත්ත,<br>ඇහැළියගොඩ |
| 02. | ඒ. ඒ. එම්. නසාර් මයා,<br>අංක 494,<br>මලව, කුරුවිට | මංකඩහේන, මලව, කුරුවිට. |

01-642

---

**කැලණිය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය අනුව කරන දැනුම් දීම යි

ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය සභාව 2013.12.30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී සම්මත කරන ලද, යෝජනාව අනුව, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මාර්ගය භාවිතා කරන ඉඩම් හිමියන් විසින් සභාව වෙත ලබා දී ඇති, ලිඛිත කැමැත්ත අනුව, එම මාවත සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ. ප්‍රදේශවාසී ජනතාව විසින් මෙම මාර්ගය සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට විරුද්ධ වන්නේ නම්, ඒ කුමන කරුණක් නිසාද යන්න සඳහන් කල ලියවිල්ලක්, පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට, දින 30 ක් ඇතුළත මා වෙත එවීමට කටයුතු කළ යුතු බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් ඉන්පසු එම පාර ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස සලකා ඉදිරියේදී පාලනය කරනු ලබන බවටත්, මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

බී. ප්‍රසන්න රණවීර,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

*මාර්ගයේ විස්තරය*

| | | |
|---|---|---|
| ග්‍රාම සේවා කොට්ඨාසය | : | 266 ඒ- කැන්දහේන |
| මාර්ගයේ නම | : | තැඹිලිගස්මුල්ල පාර |
| මාර්ගයේ ආරම්භය | : | තැඹිලිගස්මුල්ල පාරේ වාත්තු මඩුව |
| මාර්ගයේ අවසානය | : | තැඹිලිගස්මුල්ල පාරෙන් දකුණු දෙසට බෙදෙන මාර්ගය |
| මාර්ගයේ දිග | : | අඩි 66 |
| මාර්ගයේ පළල | : | අඩි 10<br>(මෙම මාර්ගයට අදාළව එම්. එච්. ඒ. තිල්මිණී මිනින්දෝරු මහත්මිය විසින් අඳින ලද අංක 36/2014 දරන මානක සැලැස්මද, සභාව සතුව පවතී.) |

*ලොට් 01*

| | | |
|---|---|---|
| උතුරට | : | තැඹිලිගස්මුල්ල පාර, |
| නැගෙනහිරට | : | ඩී. උපසේන මහතාගේ ඉඩම |
| දකුණට | : | ඩබ්. එස්. සිල්වා මහතාගේ ඉඩම, ලොට් 02න් ආර්. රාජපක්ෂ මහතාගේ ඉඩම. |
| බස්නාහිරට | : | ආර්. රාජපක්ෂ මහතාගේ ඉඩම. |

*ලොට් 02*

| | | |
|---|---|---|
| උතුරට | : | ආර්. රාජපක්ෂ මහතාගේ ඉඩම, ලොට් 01න් ඩබ්. එස්. සිල්වා මහතාගේ ඉඩම |
| නැගෙනහිරට | : | ඩබ්. ඩී. සිල්වා මහතාගේ ඉඩම, ප්‍රේමසිරි මහතාගේ ඉඩම, සිරිසේන මහතාගේ ඉඩම |
| දකුණට | : | ඩබ්. ඩී. සිල්වා, වයි. නන්දසේන, රූපසිරි, එම්. පී. සීලවතී යන අයගේ ඉඩම්, රුක්මල්පෙදෙස පාර, ගමගේ මහතාගේ ඉඩම |
| බස්නාහිරට | : | ගුණවර්ධන, ඩබ්. කේ. ඩී. පෙරේරා, එල්. ජේ. රුදිගු සහ ජේ. හෙට්ටිආරච්චි යන අයගේ ඉඩම්. |

01-647

# විවිධ දැන්වීම්

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

### 2015 වර්ෂය සඳහා බදු සහ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150(1), (2), 151, සහ 152(1) වගන්ති ප්‍රකාර සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛන වලින් දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක්ද, ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ ව්‍යාපාර (කර්මාන්ත) බද්දක්ද, ඇතැම් ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ ආදායම මත පැන වූ වාර්ෂික බද්දක්ද 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2014 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහා සභාවේ රැස්වීම් අංක 5.4 දරන සම්මුතිය මගින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එකී බලපත්‍ර ගාස්තු ව්‍යාපාර බදු හා වෘත්තීය බදු 2015 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතුය. මෙයට අමතරව රජය විසින් පනවා ඇති බදු මුදල් ද බලපත්‍ර හා බදු ගාස්තු වලට අමතරව ගෙවිය යුතුය.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,<br>සභාපති,<br>සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,<br>දුංහිඳ,<br>සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150(1), (2) සහ 151 වැනි වගන්ති යටතේ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර (කර්මාන්ත) බදු*

*I උපලේඛනය*

| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1.00 සිට රු. 750 දක්වා* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු. 1,500 දක්වා* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1 | අලෙවි කිරීම සඳහා දැව ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2 | අත් යන්ත්‍ර මගින් සිමෙන්ති බ්ලොක්, ගල් නිපදවීමේ සහ අලෙවි කිරීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 800 0 |
| 3 | අළු හුණු/දිය හුණු පැකට් කිරීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 4 | අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 5 | අයිස් ක්‍රීම් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම (ජංගම සේවය) | 300 0 | 500 0 | 750 0 |
| 6 | අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම | 300 0 | 750 0 | 800 0 |
| 7 | අත් ඔරලෝසු හා ඔරලෝසු අළුත් වැඩියාව හා විකිණීම | 350 0 | 500 0 | 750 0 |
| 8 | ආහාර ද්‍රව්‍ය විජලනය කර (කොස්/දෙල් වැනි) පැකට් කිරීම සහ අලෙවි කිරීම | 350 0 | 750 0 | 800 0 |
| 9 | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය රැස් කිරීම/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 11 | ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | උක් මෝලක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 13 | උක් හකුරු පැකට් කිරීම, ගබඩා කිරීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 14 | ඌරු කොටුවක් පවත්වාගෙන යෑම (මස් පිණිස) i. ඌරන් 10ට අඩු | 500 0 | 750 0 | 950 0 |
| 15 | ii. ඌරන් 10ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| 16 | එළවලු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 800 0 |
| 17 | එළවලු තොග එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 900 0 |
| 18 | කඩල/පේස්ට්/මුරුක්කු/රට කජු/බූන්දි වර්ග නිෂ්පාදන කිරීම, පැකට් කිරීම, අලෙවි කිරීම | 500 0 | 750 0 | 800 0 |

| අනු. අංකය | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1.00 සිට රු. 750 දක්වා රු. ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු. 1,500 දක්වා රු. ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 19. | කම්මලක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 20. | ක්ෂණික ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 300 0 | 400 0 | 600 0 |
| 21. | කිතුල් පැණි හකුරු, නිෂ්පාදනය සහ අලෙවි කිරීමේ ස්ථානයක් | | | |
| . | පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 22. | කුලියට ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 23. | කෘතිම පොහොර ගබඩා කිරීමේ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 24. | කෘෂි රසායනික බෙහෙත් වර්ග ගබඩා කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 25. | කුඩා ප්‍රමාණයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 800 0 |
| 26. | කැසට් පටි, වීසීඩී, ඩීවීඩී, අලෙවි කිරීමේ සහ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 800 0 |
| 27. | කුකුලන් මස් පිණිස 100ට අඩු | 500 0 | 750 0 | 800 0 |
| | කුකුලන් 100ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 29. | කොන්ත්‍රාත් ව්‍යාපාර සඳහා ගල්, වැලි ගඩොල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කිරි ගවයන් 05ට අඩු කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| | කිරි ගවයන් 05ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | කාර්යාලයක් පවත්වාගෙන යෑම (ගෘහ උපකරණ ගෙන්වා බෙදා හැරීම පිළිබඳව) | 500 0 | 750 0 | 800 0 |
| 32. | කැටයම් හා මූර්ති ශිල්පය | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ග්‍රොසරියක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 800 0 |
| 34. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී, කැසට් රෙකෝඩර්, ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 400 0 | 750 0 | 800 0 |
| 37. | ගෑස් අලෙවි කිරීම (සිල්ලරට) | 500 0 | 750 0 | 800 0 |
| 38. | ජංගම දුරකථන සහ අමතර කොටස් අලෙවි කිරීම | 400 0 | 750 0 | 800 0 |
| 39. | ජංගම දුරකතන අළුත්වැඩියාව | 300 0 | 500 0 | 700 0 |
| 40. | ටොෆි සිගරට් බුලත්විට කඩයක් පවත්වාගෙන යෑම | 200 0 | 250 0 | 300 0 |
| 41. | ටයර්, ටියුබ් වෝල්කනයිසින් කිරීම | 400 0 | 700 0 | 750 0 |
| 42. | නිමි ඇඳුම් අලෙවි කිරීමේ ස්ථානයක් | 450 0 | 750 0 | 800 0 |
| 43. | නිමි ඇඳුම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යෑම | 400 0 | 600 0 | 750 0 |
| 45. | තොග බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | තේ කොළ පැකට් කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 400 0 | 750 0 | 800 0 |
| 47. | ත්‍රී රෝද රථ/මෝටර් සයිකල් අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 800 0 |
| 48. | ධාන්‍ය වර්ග පිටි කිරීම, පැකට් කිරීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 800 0 |
| | පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 800 0 |
| 49. | දර මඩුවක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 800 0 |
| 51. | දේශීය සහ විදේශීය දුරකථන ඇමතුම් ලබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 450 0 | 750 0 | 800 0 |
| 52. | දුම් කොළ වියලීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 800 0 |
| 53. | දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම | 300 0 | 500 0 | 750 0 |
| 54. | දැව ගෘහ භාණ්ඩ අලෙවිය සහ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | පළතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 56. | පා පැදි අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 750 0 | 800 0 |
| 57. | පරන පත්තර, හිස් ගෝනි, බෝතල්, ඇලුමිණියම්, යකඩ සුන්බුන් එකතු කිරීම | 500 0 | 750 0 | 800 0 |
| 58. | ප්ලේන් වීදුරු ඇතුළු සියළුම වීදුරු අලවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 750 0 | 800 0 |
| 59. | පාසල් පොත්, ලිපිද්‍රව්‍ය, පුවත් පත්, සඟරා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 800 0 |

| අනු. අංකය | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1.00 සිට රු. 750 දක්වා රු. ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු. 1,500 දක්වා රු. ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 60. | ෆාමසියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 950 0 |
| 61. | පෞද්ගලික තැපැල් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 62. | පිසූ ආහාර වර්ග අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 63. | පින්තූර රාමු කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 350 0 | 750 0 | 800 0 |
| 64. | පාවහන් නිපදවීමේ, ගබඩා කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 65. | පී.වී.සී. කොන්ඩියුට් බට භාවිතයෙන් අමතර කොටස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | පවිත්‍රතා කටයුතු පිළිබඳ කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | පාරම්පරික දේශීය වෛද්‍ය ප්‍රතිකාර කිරීම | 500 0 | 750 0 | 800 0 |
| 68. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | බුලත්, පුවක්, දුම්කොළ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 800 0 |
| 71. | බුලත්, පුවක්, දුම්කොළ තොග විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 950 0 |
| 72. | බිම්මල් වගා කිරීමේ පැකට් කිරීමේ සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 800 0 |
| 73. | බැටරි චාජ් කිරීමේ සහ බැටරි වතුර අලවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 500 0 | 800 0 |
| 74. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 800 0 |
| 75. | මිරිස්, තුනපහ කුඩු පැකට් කිරීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 76. | මෝටර් රථ වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | මෝටර් රථ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ, අලවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 79. | මිරිස්, තුනපහ, කුඩු පිටි කිරීමේ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 80. | මාළු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | මාළු ටැංකි, විසිතුරු මසුන් අලවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 800 0 |
| 82. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 83. | මෝටර් සයිකල් අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 84. | යකඩ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | යතුරු පැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | රසකැවිලි නිෂ්පාදනය සහ ධාන්‍ය පිටිකර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 550 0 | 750 0 |
| 89. | රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 90. | රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | රථ වාහන විසිරි පින්තාරු (ස්ප්‍රේ පෙයින්ටින්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | රථ වාහන "ටින්කරින්" වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | ලැඟුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 95. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | ලොතරැයි අලවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 800 0 | 1,000 0 |
| 97. | වෑල්ඩින් වැඩ පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 98. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 99. | විදුලි උපකරණ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 100. | විදුලි උපකරණ අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 101. | විදේශ රැකියා ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | වතුර බෝතල් අලෙවි කිරීමේ සහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 850 0 |
| 103. | විසිතුරු මල් පැල වර්ග ප්‍රදර්ශනය කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |

| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1.00 සිට රු. 750 දක්වා රු. ශත* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු. 1,500 දක්වා රු. ශත* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත* |
|---|---|---|---|---|
| 104. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 105. | වාහන අමතර කොටස් අලෙවිය හෝ ගෙන්වා බෙදා හැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 106. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වා ගෙන යෑම/නියදි එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 107. | සිල්ලර බඩු අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 108. | සිල්ලර බඩු අලෙවි කිරීමේ වෙළඳ සැලක් පවත්වාගෙන යාම (එළවලු, පලතුරු ඇතුලුව) | 500 0 | 750 0 | 1,000 0 |
| 109. | සෙල්ලම් බඩු, මණි බඩු, විසිතුරු බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 550 0 | 750 0 |
| 110. | සිමෙන්ති මල් පෝච්චි, ග්‍රිල් වර්ග, බීරළු, බිම් ගඩොල්, විකිණිම සහ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 800 0 |
| 111. | සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 112. | සාප්පු බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 113. | සාප්පු බඩු (ප්ලාස්ටික් බඩු, සෙරෙප්පු ඇතුළුව) අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 114. | සම්භාණ්ඩ, අත් බෑග් ඇතුළු ග්‍රාමීය නිෂ්පාදන සෑදීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 800 0 |
| 115. | ස්වර්ණාභරණ නිපදවීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 116. | ශබ්ද වාහිනි යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 117. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම හෝ ඡායාරූප ගත කිරීමේ කටයුතු සඳහා ඇණවුම් භාර ගැනීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 118. | සංචාරක වෙළඳාම (පා පැදි, අත් කරත්ත, ත්‍රිරෝද රථ මගින්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 119. | ශීත කළ මස්, මාළු අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 120. | ශිත කළ කිරි අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 121. | ශිත කළ කුකුල් මස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 122. | ශිත කළ බීම වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 800 0 |
| 123. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 124. | පැල තවානක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 125. | පොල් කටු අඟුරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 126. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 127. | පරිගණක පාඨමාලාවක්/අළුත්වැඩියාව/අලෙවියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 128. | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 129. | භෝජනාගාරය (මුළුතැන්ගෙයක් රහිත) | 500 0 | 750 0 | 1,000 0 |
| 130. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

(*සැළකිය යුතුයි.*-1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතට අනුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ යම් හෝටලයක් හෝ භෝජනාගාරයක් හෝ නවාතැන් පලක් සම්බන්ධයෙන් පෙර වර්ෂයේ ආදායමෙන් 1% ක ගාස්තුවක් අය කරනු ලැබේ.)

## II *උපලේඛනය*

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තිය යටතේ පැනවෙන බදු*

*ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර ඃ*

1. පානීය ජල බෝතල් ඇසුරුම් කිරීමේ ස්ථාන
2. උකස් බඩු ගන්නා ස්ථාන
3. පෞද්ගලික පංති පැවැත්වෙන ස්ථාන
4. වෙන්දේසිකරුවන්
5. බ්‍රෝකර්වරුන්
6. දේපල වෙළඳාම් ආයතන
7. කොන්ත්‍රාත්කරුවන්
8. ලොතරැයි නියෝජිතයින්
9. රක්ෂණ නියෝජිතයින්

10. පෞද්ගලික ජල විදුලි උත්පාදන ස්ථාන
11. විදුලි සංදේශ කුළුනු හා හුවමාරු පොලවල්
12. රටබීම වෙළඳසැල්
13. බෝතල් රා අලෙවිසැල්
14. බියර් අලෙවිසැල්
15. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්
16. බැංකු හා මූල්‍ය ආයතන (ග්‍රාමීය බැංකු ඇතුළුව)
17. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
18. ගල් වලක් පවත්වාගෙන යාම
19. යන්ත්‍රානුසාරයෙන් කළු ගල් ඇඹරීමේ ස්ථාන
20. ඉන්ධන පිරවුම් හලක් පවත්වා ගෙන යාම
21. ඉන්ධන ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22. මීතිරන් පතලක් පවත්වාගෙන යාම
23. මීතිරන් ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම
24. යාන්ත්‍රික කියත් මගින් දැව ඉරා සකස් කිරීම් - අශ්ව බල 100ට අඩු යන්ත්‍ර (නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව)
25. ගංගා වැලි ගොඩ දැමීම
26. කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම

ආරම්භක ව්‍යාපාර හැරෙන්නට ඉහත සඳහන් ව්‍යාපාරයන් කරගෙන යන තැනැත්තන්ගෙන් පෙර වර්ෂයේ ඒ ඒ ව්‍යාපාරයේ ආදායම අනුව පහත දැක්වෙන පරිදි වාර්ෂික බද්දක් අයකෙරේ :-

| | *පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද*<br>*රු. ශ.* |
|---|---|---|
| 1. | රු. 6,000 දක්වා | නැත |
| 2. | රු. 6,001 සිට රු. 12,000 දක්වා | 90 0 |
| 3. | රු. 12,001 සිට රු. 18,750 දක්වා | 180 0 |
| 4. | රු. 18,751 සිට රු. 75,000 දක්වා | 360 0 |
| 5. | රු. 75,001 සිට රු. 1,50,000 දක්වා | 1,200 0 |
| 6. | රු. 1,50,000 වැඩි | 3,000 0 |

12 - 559/1

---

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988.08.23 දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වැනි කාණ්ඩයේ I වැනි ඡේදයේ විධිවිධාන ප්‍රකාර සොරණාතොට ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන වෙළඳ ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, එකී වෙළඳ ව්‍යාපාර වලින් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් හෝ වෙළඳ බද්දක් අයකිරීමටත් 2014 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මහ සභා රැස්වීම් අංක 5.11 දරන සම්මුතිය මගින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,
සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
දුංහිඳ,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳ ව්‍යාපාර***

01. අත් යන්ත්‍ර මගින් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම, අලෙවි කිරීම, ගබඩා කිරීම
02. අළුහුණු, දියහුණු, පැකට් කිරීම හා අලෙවි කිරීම

03. අලෙවි කිරීම සඳහා දැව ගබඩා කිරීම
04. ආහාර ද්‍රව්‍ය විජලනය කර (කොස්, දෙල්, වැනි) පැකට් කිරීම, අලෙවි කිරීම
05. අත් යන්ත්‍ර භාවිතයෙන් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
06. අයිස් ක්‍රීම් වෙළඳාම (ජංගම රථ මගින්)
07. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
08. ඉන්ධන ගබඩාහලක් පවත්වාගෙන යාම
09. ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් පවත්වාගෙන යාම
10. උක්මෝලක් පවත්වාගෙන යාම
11. උක් හකුරු පැකට් කිරීම, ගබඩා කිරීම හා අලෙවි කිරීම
12. ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
13. ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය එක් රැස් කිරීම, ගබඩා කිරීම
14. කඩල, පේස්ට්‍රි, මුරුක්කු, රටකජු, බූන්දි වර්ග නිෂ්පාදනය, පැකට් කිරීම හා අලෙවි කිරීම
15. කෘත්‍රිම පොහොර ගබඩා කිරීම, අලෙවි කිරීම
16. කෘෂි රසායන බෙහෙත් වර්ග ගබඩා කිරීම හා අලෙවි කිරීම
17. කුඩා ප්‍රමාණයේ ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
18. කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම හා කුකුළන් අලෙවි කිරීම
19. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (ගව හා එළු)
20. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
21. කොන්ත්‍රාත් ව්‍යාපාර සඳහා ගල්, වැලි, ගඩොල් ගබඩා කිරීම
22. කම්මලක් පවත්වාගෙන යාම
23. ගල් වලක් පවත්වාගෙන යාම
24. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම
25. ගෑස් අලෙවි කිරීම හා ගබඩා කිරීම
26. ගංගා වැලි ගොඩ දැමීම (අවශ්‍ය නීතිමය අවශ්‍යතා සපුරා ඇත්නම්)
27. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
28. තේ කොළ පැකට් කිරීම හා අලෙවි කිරීම
29. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
30. ධාන්‍ය වර්ග පිටි කිරීම, පැකට් කිරීම හා අලෙවි කිරීම
31. දර මඩුවක් පවත්වාගෙන යාම
32. ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
33. දුම්කොළ වියළීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. දැව ගෘහ භාණ්ඩ නිපදවීම
35. ජල විදුලි බාලාගාරයක් පවත්වාගෙන යාම
36. පරණ පත්තර, හිස් ගෝනි, බෝතල්, ඇලුමිනියම්, යකඩ සුන්බුන් එකතු කිරීම
37. ප්ලේන් වීදුරු, අලෙවි කිරීම හා ගබඩා කිරීම
38. පී.වී.සී. කොන්ඩියුට් බට භාවිතයෙන් අමතර කොටස් නිෂ්පාදනය
39. ෆාමසියක් පවත්වාගෙන යාම
40. පානීය ජල බෝතල් නිෂ්පාදනය කිරීම, ඇසුරුම් කිරීම හා අලෙවි කිරීම
41. පිසූ ආහාර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. බියර් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. බෝතල් කළ රා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. බිම් මල් වගා කිරීමේ, පැකට් කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. බැටරි චාජ් කිරීමේ හා බැටරි වතුර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. මත් පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. මිරිස් තුන පහ කුඩු, පැකට් කිරීම හා අලෙවි කිරීම
48. මෝටර් රථ වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
49. මෝටර් රථ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. මිරිස්, තුනපහ කුඩු පිටි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. මාළු ටැංකි, විසිතුරු මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. මස් පිණිස ඌරු කොටුවක් පවත්වාගෙන යාම
53. මුද්‍රණ ශාලාවක් පවත්වාගෙන යාම
54. මිනිරන් පතලක් පවත්වාගෙන යාම
55. මිනිරන් ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම
56. මෝටර් රථ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. යකඩ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය අලෙවි කිරීම
58. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම හා අලෙවි කිරීම

59. යන්ත්‍රානුසාරයෙන් කළු ගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
60. යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. රස කැවිලි නිෂ්පාදනය හා අලෙවි කිරීම
62. රථ වාහන විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. රථ වාහන ටින්කරින් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
65. ලී මෝලක් පවත්වාගෙන යාම
66. වඩු මඩුවක් පවත්වාගෙන යාම
67. වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
68. වී මෝලක් පවත්වාගෙන යාම
69. විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. වතුර බෝතල් අලෙවි කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම/නියදි එකතු කිරීම
72. සංචාරක වෙළෙඳාම (පාපැදි, අත්කරත්ත, ත්‍රීරෝද රථ වාහන මගින්)
73. ශීත කළ මස්, මාළු අලෙවි කිරීම
74. ශීත කළ කිරි අලෙවි කිරීම
75. ශීත කළ කුකුල් මස් අලෙවි කිරීම
76. හුණු පෝරණුවක් පවත්වාගෙන යාම

01 - 559/2

---

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

**2015 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසරය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221(1) හා 122(1) 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ (iv) (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලදුව, සොරණාතොට ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාව 39 වැනි ඡේදය යටතේ සොරණතොට ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම් වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2015 ජනවාරි මස 01 වැනි දින සිට නැවතත් සංශෝධනය කරන තුරු අය කරනු ලබන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,
සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
දුංහිඳ,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *ප්‍රචාරක දැන්වීම් විස්තර* | *අවසර පත්‍ර සඳහා ගාස්තු* |
|---|---|
| | *රු. ශත* |
| 01. ප්‍රචාරක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා කිසියම් ස්ථානයක සවි කිරීමේදී එක් හතරැස් අඩියක් සඳහා | 30 0 |
| 02. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකි වන පරිදි යම් තැනක සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා එක් හතරැස් අඩි එකක් සඳහා | |
| මසකට | 20 0 |
| වර්ෂයකට | 30 0 |

01 - 559/3

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තිය ප්‍රකාර සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය නොකරන ප්‍රදේශවල පිහිටියා වූ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාර් එකක් සඳහා රු. 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් ද, එම ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු වුවත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක රු. 50 ක වාර්ෂික අක්කර බද්දක් ද පනවා අය කිරීමට 2014 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මාසික මහ සභා රැස්වීමේ තීරණ අංක 5.11 යටතේ සම්මත කරන ලද බවත්, එම ගාස්තු 2015 මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් වන අයුරින් කාර්තු හතරකින් අයකර ගැනීමට තීරණය කර ඇති බවත්, එකී කාර්තු අවසන් වීමට පෙර එම බද්ද ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,<br>
සභාපති,<br>
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,<br>
දුංහිද,<br>
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01 - 559/4

---

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134(1) හා (2) වගන්ති ප්‍රකාරව සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කළ කන්දෙගෙදර වරිපනම් බදු අයකරන සීමාව තුළ පිහිටියා වූ සියලුම නිශ්චල දේපළවලින් වරිපනම් බදු 6%ක ප්‍රතිශතය නැවත සංශෝධනය කරන තුරු පහත දැක්වෙන පරිදි අයකිරීමට 2014 ඔක්තෝබර් මස 30 වැනි දින පැවති මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.11 යටතේ සම්මත කරන බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

02. එම බදු මුදල් පිළිවෙලින් 2015 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන පරිදි කාර්තු හතරකින් ගෙවිය යුතු ය.

03. වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර බදු මුදල් ගෙවනු ලබන පාරිභෝගිකයන්ට 10%ක වට්ටමක් අඩු කරනු ලැබේ. එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ ඒ කාර්තුවේ ප්‍රථම මාසය අවසන් වීමට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් 5%ක වට්ටමක් අඩු කරනු ලැබේ.

04. ඉහත කී 02 ඡේදයේ ප්‍රකාර ගෙවිය යුතු බදු මුදල් නොගෙවන අයගේ දේපළ වෙනුවෙන් 10%ක වරෙන්තු ගාස්තුවක් අය කරනු ලැබේ.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,<br>
සභාපති,<br>
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,<br>
දුංහිද,<br>
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01 - 559/5

---

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශයක් ලෙසට පත්කර ඇති රිදීපාන වසමේ රිදීපාන, මැඩිතලේ ප්‍රදේශවල වරිපනම් බදු පැනවීම - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු වූ ප්‍රදේශයක් ලෙසට සොරණාතොට ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති හා පළාත් පාලන කොමසාරිස් විසින් අනුමත කර ඇති සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් රිදීපාන වසමේ රිදීපාන, මැඩිතලේ යන ප්‍රදේශවල පිහිටි දේපළවලින් ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් ලබා දී ඇති අනුමැතිය පරිදි එකී දේපළවල වාර්ෂික වටිනාකමින් 3%ක වරිපනම් බද්දක් 2015 වර්ෂය සඳහා පනවා, 2015 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන්

වන පරිදි කාර්තු 4කින් අයකර ගැනීමට තීරණය කර ඇති බව ද, එකී කාර්තු අවසන් වීමට පෙර අදාළ බදු මුදල් ගෙවිය යුතු බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාරව වාර්ෂික බදු මුදල් ගෙවන්නේ නම් පහත දැක්වෙන පරිදි වට්ටම් මුදල් ප්‍රදානය කරන බව ද දැනුම් දෙනු ලැබේ.

ජනවාරි 31 වැනි දිනට පෙර වර්ෂයේ සම්පූර්ණ බදු මුදල් ගෙවන්නේ නම් 10%ක වට්ටමක් ද, කාර්තු වශයෙන් ගෙවන්නේ නම්, කාර්තුවේ පළමු වැනි මාසය තුළ ගෙවනු ලැබුවහොත් 5%ක වට්ටමක් ද, අඩු කරනු ලැබේ.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,
සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
දුංහිද,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01 - 559/6

---

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත බදු අය කිරීම

සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩම් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු, හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයාගේ අනු නියෝජිතයා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි. තවද මෙම බද්ද ක්‍රියාත්මක දිනය 2013.01.01 වැනි දින සිට බවද දැනුම් දෙමි. මෙම බද්ද 2015.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව ද දැනුම් දෙමි.

ඩබ්. ජී. නීල් ප්‍රේමතිලක,
සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
දුංහිද,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01 - 559/7

---

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

### ජල ගාස්තු අය කිරීම

